**දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය- 2014 අගෝස්තු 05 සිට 2014 දෙසැම්බර් 31 දක්වා**

---------------------------------------------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ (දේඅවයා) 2014 අගෝස්තු 05 සිට 2014 දෙසැම්බර් 31 දක්වාවූ පලමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වු මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජූලි 10 දින එළඹි අංක 5417 එල් කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09 (ආ) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------------

මූල්‍ය ගිවිසුමට අනුව දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ එවකට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දේශගුණ අවදානම් ඇති විය හැකි ජනතාව හා වත්කම් අනතුරු වලට භාජනය වීම අඩුකිරීමට සහ ආපදා වලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය වැඩිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 14,617 කට සමාන එජඩො මිලියන 111.8 ක් වු අතර එයින් රු.මිලියන 14,382 කට සමාන එජඩො මිලියන 110ක් හෝ සියයට 98.39 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2014 අගෝස්තු 05 දින ආරම්භ කළ අතර 2019 මැයි 30 අවසන් කිරීමට නියමිත විය.

<u>මූල්‍ය සැලැස්ම</u>

මූල්‍ය ගිවිසුම අනුව දේශීය අරමුදල් ඇතුළුව එජඩො මිලියන 111.8 ක ව්‍යාපෘති මූල්‍ය සැලැසුම පහත දැක්වේ.

| **අරමුදල් ප්‍රභවය** | **සංරචකය** | **විගැහි මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
|---|---|---|---|---|
| --------- | ----------- | --------- | --------- | -------- |
| **ජාසංස** | **නිම්න භූමි සංවර්ධන ආයෝජන සැලැස්ම** | **8.45** | **13.0** | **1,700** |
| | **දේශගුණ ප්‍රත්‍යස්ථිති යටිතල පහසුකම් වැඩි කිරිම** | **58.50** | **90.0** | **11,767** |
| | **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම** | **3.25** | **5.0** | **654** |
| | **හදිසි අසම්භාව්‍යතාවයන්ට ප්‍රතිචාර** | **1.30** | **2.0** | **262** |
| **ශ්‍රීලංර** | **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම** | **-** | **1.8** | **234** |
| | | ------ | ------ | -------- |
| | **එකතුව** | **<u>71.70</u>** | **<u>111.8</u>** | **<u>14,617</u>** |

**විනිමය අනුපාතය: එජඩො 1 =රු. 130.75**

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**----------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍යානය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ලබාදීමට එකඟ වූ වටිනාකම | | 2014 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන | සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය | 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.ස | 110.0 | 14,382 | 220.81 | 132.7 | 1.02 | 132.7 |
| ශ්‍රී.ලං.ර | 1.8 | 235 | - | 13.9 | - | 13.9 |
| එකතුව | 111.8 | 14,617 | 220.81 | 146.6 | 1.02 | 146.6 |

(ආ) 2014 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම අනුව ව්‍යාපෘති කටයුතු සඳහා රු.මිලියන 221 ක වෙන් කර තිබුණද, ණය මුදල් වලින්, පහත විස්තර කර ඇති පරිදි 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 132. 8 එනම් සියයට 60 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

| සංරචකය | වෙන්කිරීම | තත්‍ය වියදම | උපයෝජනය |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | % |
| **නිම්න භූමි සංවර්ධන ආයෝජන සැලැස්ම** | **-** | **-** | |
| **දේශගුණ ප්‍රත්‍යස්ථිති යටිතල පහසුකම් වැඩි කිරිම** | **214.41** | **130.32** | **61** |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** | **6.40** | **2.48** | **39** |
| **හදිසි අසම්භාව්‍යතාවයන්ට ප්‍රතිචාර** | **-** | **-** | |
| **එකතුව** | **220.81** | **132.8** | |

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලය සඳහා ව්‍යාපෘතිය ආරම්භයේදීම ව්‍යාපෘතියේ පූර්ව නිශ්චිත ඉලක්ක නිශ්චිත කාලයන් තුළ ආර්ථිකමය හා කාර්යක්ෂම ලෙස ලඟා කර ගැනීම තහවුරු වන පරිදි සමස්ත ව්‍යාපෘති සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් නියාමනය කිරීමට එවැනි ව්‍යාපෘති සැලැස්මක් සහ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. එම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය විගණනයේදී ඇගයීමට ලක් කළ නොහැකි විය.

**3.3 මූල්‍ය පාලන සම්බන්ධ ගැටළු**

**-------------------------------**

ප්‍රතිපූර්ණය කිරිමේ පදනම මත මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගන්නා අරමුදලින්, ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති වියදම් සිදුකිරීම පහසුව සඳහා 2014 ඔක්තෝබර් 02 දින දේශීය වානිජ බැංකුවක විශේෂ (ඩොලර්) අත්තිකාරම් ගිණුමක් විවෘත කර තිබුණි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී වටිනාකම රු.මිලියන 97.79 ක මුදල් ප්‍රතිපූර්ණයන් සඳහා අවස්ථා 2කදී අත්තිකාරම් ලෙස රු. මිලියන 100 ක් ලබා ගෙන තිබුණි. එසේම 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,830 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 13.97 ක වටිනාකමක ශේෂයකට අමතරව මෙම ගිණුමේ රු. මිලියන 2.21 ක ශේෂයක් පැවතිනි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් පත්වීම් ලිපි නිකුත් නොකර සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ආයතන වලින් නිදහස් කළ නිලධාරීන් 400 ක් සඳහා රු.මිලියන 13.9 ක දීමනා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියෙහි පූර්ණ කාලීන පදනම යටතේ සේවය කරන නිලධාරීන් හය දෙනෙකු සඳහා පත්වීම් ලිපි කිසිවක් නොමැතිව 1/3 දීමනා ලෙස රු. මිලියන 1.4 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.